// 

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2388/09 – 2024 ජුනි මස 10 වැනි සඳුදා – 2024.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/13.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව–

ටී. එන්. ඒ. පී. වික්‍රමතිලක මයා, අංක 79/9, නිවාස මහලේකම් ගොඩනැගිල්ල, යටිනුවර වීදිය, මහනුවර

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, ගුරුදෙනිය, කැඳවල, මඩිත්ත අංක 286 හි, නීතිඥ එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

1A – G042060 – 14 (2024/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2022/13.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ටී. එන්. ඒ. පී. වික්‍රමතිලක මයා, අංක 79/9, නිවාස මහලේකම් ගොඩනැගිල්ල, යටිනුවර වීදිය, මහනුවර

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ටී. එන්. ඒ. පී. වික්‍රමතිලක මයා විසින් ඉල්ලා ඇති

1. HM 1-1 සහකාර සාමාන්‍යාධිකාරි (මා. සම්. කළ. හා පාලන) තනතුර සඳහා හිමිකම් තිබේ ද යන්නත්

2. MM 1-1 ii ශ්‍රේණියට අදාළ 2022.01.01 සිට 2023 මාර්තු මාසය දක්වා හිඟ වැටුප් හා 2017.10.01 දින සිට මේ දක්වා හිඟ වෘත්තීය දීමනා සඳහා හිමිකමක් තිබේ ද යන්නත්,

එසේ හිමිකමක් තිබේ නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ''.

**එම්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන

EOG 06 - 0086

මගේ අංකය: IR/COM/02/2020/234.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එස්. පී. ටී. සී. කේ. ගුණරත්න මයා, අංක 173/ඩී, බෝපෙත්ත, උෟරපොල.

හා

2. එම්. පී. සී. ජී. කුමාරසිංහ මයා, අංක 63/ඩී/2, අස්සැන්නවත්ත, දිවුලපිටිය (ඇතුළු සේවකයින් 16 දෙනා)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, අංක 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, අංක 10/51, වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2020/234.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එස්. පී. ටී. සී. කේ. ගුණරත්න අංක මයා, 173/ඩී, බෝපෙත්ත, ඌරපොල.

හා

2. එම්. පී. සී. ජී. කුමාරසිංහ මයා, අංක 63/ඩී/2, අස්සැන්නවත්ත, දිවුලපිටිය (ඇතුළු සේවකයින් 16 දෙනා)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, අංක 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ සේවය කළ එස්. පී. ටී. සී. කේ. ගුණරත්න මයා හා එම්. පී. සී. ජී. කුමාරසිංහ මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 16 දෙනා වසර 11කට වැඩි කාලයක් කොන්ත්‍රාත් පදනමින් එකම ආයතනයක අඛණ්ඩව සේවය කළ ද,

* ස්ථිර සේවයට ඇතුළත් නොකිරීම,

* ස්ථිර කාර්ය මණ්ඩලයට ලබාදෙන දීමනා, සහන, හිමිකම් හා වරප්‍රසාද හිමි ද හිමිනම් එය ලබා නොදීම,

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

1. එස්. පී. ටී. සී. කේ. ගුණරත්න
2. එම්. පී. සී. ජී. කුමාරසිංහ
3. කේ. එල්. විජයගුණරත්න
4. ඒ. ඩී. ආර්. ආර්. ආටිගල
5. බී. එන්. ඒ. දුමින්ද
6. රාජිත හේරත්
7. ජේ. එම්. සලනි සම්මානි
8. ආර්. එල්. ආර්. එම්. රණසිංහ
9. ටී. එල්. වික්‍රමතිලක
10. ජේ. එස්. වී. සී. එච්. සොයිසා
11. ජේ. ඒ. ඩී. කුමාර
12. ඩබ්. එම්. ඩබ්. අයි. වන්නිනායක
13. ඊ. කේ. පී. පාරින්ද්‍යා
14. ඊ. ඒ. ඩෙලිකන්
15. ජේ. එම්. ඩී. ජයසිංහ
16. ටී. ඒ. ටී. එම්. කීර්තිසේන

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 - 00 87